(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(1).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2016 දෙසැම්බර් මස 16 වැනි සිකුරාදා

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 188/'16

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

(අ) බ්‍රසීලයෙහි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ ඇමරිකා එක්සත් ජනපදයෙහි, නිව්යෝක් නුවර, එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත කාර්යාලය සඳහා කාර්යාල මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් ස්ථානය වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් දරන ලද වියදම කවරේද;

(ආ) මෙකී මිලදී ගැනීම් නිසි පරිදි අනුමත කොට තිබේද;

(ඇ) මෙකී එක් එක් ස්ථාන සඳහා වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ඈ) මෙකී ස්ථාන මිලදී ගැනීමට වගකිව යුතු හා / හෝ උපදෙස් දුන් නිලධාරීන් නම් වශයෙන් කවරේද;

(ඉ) සිය පරීක්ෂණ සඳහා අදාළ වන්නේ යැයි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් සලකනු ලබන වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කොට බලා වාර්තා කරනු පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2) (අ) ගරු කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා පත්කළ යුතු ය.

(ආ) අංක 95 වැනි පාර්ලිමේන්තු ස්ථාවර නියෝගයෙහි කුමක් සඳහන්ව තිබුනද කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(3) එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමටද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ප්‍රතිඥා හෝ දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

(4) සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.